# FORMS
# OF
# GOVERNMENT
# (Part I)

# රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය බෙදීම පදනම් කොට ගෙන පවත්නා ආණ්ඩුක්‍රම ආකෘති

## ඒකීය ආණ්ඩුක්‍රම

ඒකීය ආණ්ඩුක්‍රමයක රාජ්‍ය ස්වාධිපත්‍ය මුළුමනින් ම රැඳී පවතින්නේ මධ්‍යම ආණ්ඩුව වෙත ය. ඒකීය ආණ්ඩුක්‍රමයක ව්‍යවස්ථානුකූල උත්තරීතරත්වය මධ්‍යයට පවරා තිබීම හේතුවෙන් පළාත් ආණ්ඩු ඇතුළු ඕනෑ ම පර්යන්ත ක්‍රමයක් පවතින්නේ මධ්‍යම ආණ්ඩුවේ කැමැත්ත පරිදි ය.

ClassWork.LK

මෙය සංවරණය නොවූ මධ්‍යගතකරණ තත්ත්වයක් නිර්මාණය කරයි. මධ්‍යම ආණ්ඩුවට සිය අභිමතය පරිදි පළාත් ආණ්ඩු ආයතන නැවත හැඩ ගැස්වීමටත්, නැවත සංවිධානය කිරීමටත්, අහෝසි කිරීමටත් හැකියාව ඇත.

එමෙන්ම එම ආයතනවල බලතල සහ වගකීම් පුළුල් කිරීමට මෙන්ම ඉතා පහසුවෙන් හකුළුවා දැමීමට ද හැකි ය.

ලෝකයේ බොහෝ රාජ්‍ය සංවිධානය වී ඇත්තේ ඒකීය පාලන ක්‍රමයක් ලෙස ය. විශේෂයෙන් දැඩි ජනවාර්ගික බෙදීම්වලින් තොර කුඩා ප්‍රජාතන්ත්‍රවාදී රටවල ඒකීය පාලන ව්‍යුහයන් සම්මතයක් බවට පත් ව තිබේ.

සන්ධීයවාදයේ සංකීර්ණත්වය සමඟ සසඳන විට, ඒකීය පාලන ව්‍යුහය සැලකිය හැක්කේ සරල හා සාපේක්ෂ වශයෙන් කාර්යක්ෂම ක්‍රමයක් ලෙස ය. (කෙසේ වෙතත්, ප්‍රායෝගිකව, ඒකීය ක්‍රමවල මධ්‍යය සහ පරිධිය අතර ඇති සම්බන්ධතාව සන්ධීය ක්‍රමවල මෙන් සංකීර්ණ ය.)

ClassWork.LK

## ඒකීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ

රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය තනි, ජාතික ආයතනයකට පවරා තිබීම.

ඒකීය ආණ්ඩුක්‍රමවල ස්වාධිපත්‍ය බලය මුළුමනින් ම පැවරී ඇත්තේ ජාතික මධ්‍යම ආණ්ඩුව වෙත ය.

ධුරාවලි සැලසුමකට අනුව ගොඩ නංවා ඇති ආණ්ඩු ආයතන රටාව මඟින් මධ්‍යම ජාතික ආණ්ඩුව විසින් පහළ මට්ටමේ ආයතන අහෝසි කිරීමේ අධිකාරිත්වය හිමි කරගනී.

මධ්‍යයේ ව්‍යවස්ථාදායකයේ උත්තරීතරත්වය පිළිබිඹු වන අන්දමට ඒකීය රාජ්‍යවල ජාතික ව්‍යවස්ථාදායකය ඒක මණ්ඩලවාදය මත පදනම් වේ.

ෆෙඩරල් ආණ්ඩුක්‍රමයට සාපේක්ෂව ඒකීය ආණ්ඩුක්‍රමය සාපේක්ෂ වශයෙන් අසංකීර්ණ සහ කාර්යක්ෂම ආණ්ඩුක්‍රමයක් ලෙස ද දැක්වේ.

ClassWork.LK

## ඒකීය ආණ්ඩුක්‍රමයේ ප්‍රවණතා

ඒකීය ආණ්ඩු ක්‍රියාකාරිත්වය නිරන්තරයෙන් ම පරිපාලනමය විමධ්‍යගතකරණයට ලක් වේ. එනම් පහළ මට්ටම්වලට වැඩි වැඩියෙන් පරිපාලන වගකීම් පැවරීම ය. මෙය දේශපාලන බලය පහළට පැවරීමක් නොවේ.

1990 දශකයේ සිට බොහෝ ඒකීය රාජ්‍යයන් පහළ මට්ටම්වලට වැඩි වැඩියෙන් වගකීම් පැවරීමේ උත්සාහයක් දක්නට ලැබේ. ඒකීය රාජ්‍යයන්හි මධ්‍යයේ සිට පහළ මට්ටම්වලට පරිපාලන බලය විසුරුවා හැරීම ප්‍රධාන ආකාර තුනකින් සිදු විය හැකි ය.

## 1. බලය විතැන් කිරීම (deconcentration)

බලය විතැන් කිරීම මුළුමනින් ම පරිපාලනමය කාර්යයකි. මේ යටතේ සිදු වන්නේ මධ්‍යම ආණ්ඩුවේ කාර්ය මණ්ඩල අගනගරයෙන් පිටත වෙනත් ප්‍රදේශවල සේවය සඳහා යෙදවීමය. එහි අරමුණ වන්නේ පරිපාලන කටයුතු පුළුල් කිරීම, ආණ්ඩුවේ පරිපාලන කටයුතු සඳහා කෙරෙන වියදම් අඩු කිරීම යනාදිය යි.

ClassWork.LK

## 2. පරිපාලනය විමධ්‍යගත කිරීම (decentralization)

මින් අදහස් වන්නේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ වගකීම පළාත් පාලන වැනි උපජාතික ආයතනවලට පැවරීමය. බ්‍රිතාන්‍යය සහ ස්කැන්ඩිනේවියානු රටවල් මේ සම්බන්ධයෙන් හොඳ ම උදාහරණය යි.

එවැනි රටවල් විසින් පළාත් ආණ්ඩු මධ්‍යම ආණ්ඩුවේ එකඟතාව ඇති ව හෝ නැති ව හෝ සුභසාධක වැඩසටහන් ක්‍රියාත්මක කරයි. උදාහරණයක් වශයෙන්, එක්සත් රාජධානියේ පළාත් ආණ්ඩු මධ්‍යම ආණ්ඩුව විසින් සකස් කරනු ලබන සැලසුම් ක්‍රියාවට නංවයි.

ClassWork.LK

## 3. බලය පැවරීම (devolution)

මින් අදහස් වන්නේ ඇතැම් ව්‍යවස්ථාදායක බලතලද ඇතුළුව තීරණ ගැනීමේ ස්වාධීනත්වය මධ්‍යම ආණ්ඩුව විසින් පහළ මට්ටම්වලට ලබා දීම යි. ප්‍රංශයේ, ඉතාලියේ සහ ස්පාඤ්ඤයේ ප්‍රදේශීය ආණ්ඩු මේ සම්බන්ධයෙන් උදාහරණ වශයෙන් දැක්විය හැකි ය.

එක්සත් රාජධානිය විසින් 1999 දී ස්කොට්ලන්තයට සහ වේල්සයට බලය බෙදා පවරන ලද පාර්ලිමේන්තු පනත් හඳුන්වා දෙන ලදි. එසේ වුව ද එරට මධ්‍යම ආණ්ඩුවේ පාර්ලිමේන්තුවට සාමාන්‍ය පනතක් සම්මත කිරීම මගින් එලෙස පවරන ලද බලය අහෝසි කළ හැකි ය.

ClassWork.LK

# සහසන්ධීය ක්‍රමය

සහසන්ධීය යන්නෙන් වාචික වශයෙන් අදහස් වන්නේ එකඟතාව යි. සහසන්ධීය ක්‍රමය යනු ස්වාධීන රාජ්‍ය ඒකක අතර සමීප සහයෝගයක් ඇති කරගැනීමට ඒවා අතර ඇති කරගත් එකඟතාවකි. බොහෝ විට එකඟතාවක් / ගිවිසුමක් මඟින් සහසන්ධීය ආණ්ඩුක්‍රමය නිර්මාණය කරගනු ලබන අතර, පසු ව පොදු ව්‍යවස්ථාවක් සම්මත කරගැනේ.

ආරක්ෂාව, විදේශ කටයුතු, පොදු මූල්‍ය ඒකක වැනි බැරෑරුම් ගැටලුවලට මුහුණ දීමේ අරමුණෙන් සහසන්ධීය ආණ්ඩුක්‍රම ආණ්ඩු බිහි වී ඇත.

මේ අනුව සහසන්ධීය ක්‍රමයක් යනු සියලු ඒකකවලට අදාළ ව පොදු කාර්යයන් සඳහා වූ දේශපාලන ඒකකවලින් සමන්විත සංගමයකි. එනම් විශේෂිත අරමුණු ඉටු කරගැනීමේ අපේක්ෂාවෙන් ස්වාධිපති බලය සහිත රාජ්‍ය විසින් මධ්‍යම ආණ්ඩුවට සීමිත බලයක් ලබා දෙන ආණ්ඩුක්‍රමයකි.

ClassWork.LK

සහසන්ධීය ක්‍රමයක ප්‍රාන්ත ආණ්ඩු බලතලවලින් වැඩි ප්‍රමාණයක් දරන අතර මධ්‍යම ආණ්ඩුවට ඇත්තේ සුළු බලතල ප්‍රමාණයකි. මධ්‍යම ආණ්ඩුව කළ යුත්තේ කුමක් ද යන්න තීරණය කරනු ලබන්නේ ප්‍රාන්ත ආණ්ඩු විසිනි.

සහසන්ධීය ක්‍රමයට ඓතිහාසික උදාහරණය ලෙස Articles of Confederation යටතේ ගොඩ නඟන ලද ඇමෙරිකානු ආණ්ඩුක්‍රමය දැක්විය හැකි ය. නූතන උදාහරණය ලෙස ස්විට්සර්ලන්තය දැක්විය හැකි ය.

ClassWork.LK

ClassWork.LK